සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

80 S I

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

6386

විභාග අංකය .................................... **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** කාලය පැය 01යි.

**සැලකිය යුතුයි -:**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් පත්‍රය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (X) ලකුණ යොදන්න.**

(01) ලොව පළමු සංඛ්‍යාංක ඉලෙක්ට්‍රෝනික පරිගණකය වන්නේ,
i. ආකලන යන්ත්‍රය Pascaline ii. ඇබකසය ABACUS
iii. ENIAC iv. Mark 1 - Automatic Sequence Control Calculator

(02) ගුණාත්මක තොරතුරක ලක්ෂණයක් <u>නොවන්නේ,</u>
i. ගුණාත්මක බව ii. නිරවද්‍ය බව iii. අංගසම්පූර්ණ බව iv. විශාලත්වය

(03) ප්‍රතිසම (Analog), අංකිත (Digital) හා දෙමුහුම් (මිශ්‍ර - Hybrid) ලෙස පරිගණක වර්ගීකරණය කරනු ලබන්නේ,
i. ප්‍රමාණය අනුව සැලකීමෙනි. ii. භාවිතා වන තාක්ෂණය සැලකීමෙනි.
iii. යොදා ගන්නා කාර්ය සැලකීමෙනි. iv. පරිගණකයේ වේගය සැලකීමෙනි.

(04) පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A. යතුරු පුවරුව (Keyboard) ආදාන උපක්‍රමයකි.
B. මෙහෙයුම් යෂ්ටිය (Joystick) ආවයන උපක්‍රමයකි.
C. සුසංහිත ඩිස්කය (Compact Disk) ආවයන උපක්‍රමයකි.
ඒ අනුව සත්‍ය ප්‍රකාශය වන්නේ,
i. A පමණයි. ii. B පමණයි.
iii. A සහ C පමණයි. iv. A, B සහ C යන සියල්ලම.

(05) ද්විතික ආවයනය සඳහා චුම්භක තැටි භාවිතා කිරීම ආරම්භ කරන ලද්දේ,
i. දෙවන පරම්පරාවේ පරිගණක වලය. ii. තෙවන පරම්පරාවේ පරිගණක වලය.
iii. පළමුවන පරම්පරාවේ පරිගණක වලය. iv. සිව්වන පරම්පරාවේ පරිගණක වලය.

(06) පහත ප්‍රකාශ සලකා බලන්න.
A. තාප මුද්‍රකය සංඝට්ටන වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයකි.
B. සංඝට්ටන වර්ගයේ මුද්‍රක වල භාවිතා වන තීන්ත රිබන මිලෙන් අධිකය.
C. ගුණාත්මක රූප හා ලේඛන ලබා ගැනීම සඳහා වඩාත් සුදුසු වන්නේ ලේසර් මුද්‍රකයයි.
පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශ/ප්‍රකාශය වන්නේ,
i. A පමණි. ii. C පමණි.
iii. B සහ C පමණයි. iv. A, B සහ C යන සියල්ලම.

(07) පරිගණක ජාලකරණයේ <u>අවාසියක්</u> වන්නේ,
i. සම්පත් හවුලේ භාවිතය.
ii ඕනෑම තැනක දී ඕනෑම වේලාවක දී සම්බන්ධවීමේ හැකියාව.
iii. පරිගණක වෛරස ඇතුළුවීමෙන් අනෙක් පරිගණක වලටද පැ.ිර යාමේ හැකියාව.
iv. අඩු ඉඩ කඩක දත්ත ගබඩා කිරීම.

(08) විශ්ව ශ්‍රේණිගත බස්කෙවෙනි හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය වන්නේ,
i. එම කෙවෙනියට යතුරු පුවරුව සවිකිරීමට ප්‍රථම පරිගණකය ක්‍රියා විරහිත කළ යුතුය.
ii. විවිධ ආකාරයේ උපකරණ කීපයක් මෙම කෙවෙනියට සම්බන්ධ කළහැක.
iii. සම්බන්ධකරණ උපක්‍රම ක්‍රියාත්මක වීමට අවශ්‍ය විදුලි බලයද එම කෙවෙනිය හරහාම ලැබේ.
iv. උපක්‍රම සවිකළ විගසම ක්‍රියාත්මක කළහැක.

(09) ගිනිපවුර යනු,
i. පරිගණක ජාලයක තොරතුරු තැන්පත් කිරීම සඳහා භාවිතා කරනු ලබන උපක්‍රමයකි.
ii. අන්තර්ජාලය හා පරිගණක ජාලයක් අතර, ආරක්ෂක බාධකයක් ලෙස කටයුතු කරන දෘඩාංගයක් හෝ මෘදුකාංගයක් වේ.
iii. පරිගණක වෛරසය ඇතුළුවීම වලක්වන උපකරණයකි.
iv. පරිගණක ජාලයක දී පරිගණක එකිනෙකට සම්බන්ධ කිරීම සඳහා යොදා ගනු ලබන උපකරණයකි.

(10) 12012 යන සංඛ්‍යාවේ පාදය විය නොහැක්කේ,
i. තුන ii. අට iii. හතර iv. දෙක

(11) $1010_{දෙක}$ සහ $1011_{දෙක}$ යන සංඛ්‍යා දෙකේ එකතුව වන්නේ,
i. $22_{දහය}$ ii. $16_{ෂඩ්දශමය}$ iii. $25_{අෂ්ටම}$ iv. $10011_{ද්විමය}$

(12) පහත දැක්වෙන සංඛ්‍යා අතුරින් BCD සංඛ්‍යාවක් විය හැක්කේ,
i. 1010 0001 ii. 1001 0000 iii. 1000 1010 iv. 1001 1011

(13) රූපයේ දැක්වෙන තර්ක ද්වාරයේ ආදානයලෙස 1 හා 0 ලබාදුනහොත් ප්‍රතිදානයන් පිළිවෙලින් දැක්වෙන්නේ කුමන පිළිතුරේද?

i. 1 හා 0 ය.
ii. 0 හා 1 ය.
iii. 0 හා 0 ය.
iv. 1 හා 1ය.

(14) රූපයේ දැක්වෙන තර්ක ද්වාරය සඳහා වගුවේ දැක්වෙන පිළිවෙලින් ආදාන ලබාදුන් විට ප්‍රතිදානයන් පිළිවෙලින් දැක්වෙන්නේ කුමන පිළිතුරේද?



| ආදාන | |
|---|---|
| A | B |
| 0 | 0 |
| 0 | 1 |
| 1 | 0 |
| 1 | 1 |

i. 0110
ii. 0111
iii. 1110
iv. 0001

(15) පරිගණකයක් ක්‍රියාත්මක වීම ආරම්භ කිරීමේ දී මුලින්ම ක්‍රියාත්මක වන ක්‍රමලේඛ පිහිටා ඇත්තේ,
i. සසම්භාවී ප්‍රවේශ මතකයේය. ii. මතක රෙජිස්තර වලය.
iii. වාරක මතකයේය. iv. පඨන මාත්‍ර මතකයේය.

(16) පහත දැක්වෙන ගොනු දිගු අතරින් ක්‍රමලේඛ ගොනුවක දිගුවක් විය හැක්කේ කුමන දිගුවද?
i. .docx ii. .jpeg iii. .wmf iv. .exe

17) ඒක පරිශීලක බහුකාර්ය මෙහෙයුම් පද්ධතියට උදාහරණයක් වන්නේ,
i. MS DOS ii. Windows 8 iii. Unix iv. Ubuntu Server

(18) වදන් සැකසුම් මෘදුකාංග වල භාවිතා කරන කෙටිමං යතුරු සම්බන්ධව පහත දැක්වෙන වගන්ති සලකා බලන්න.
A. Ctrl + C යන්න පාඨ හෝ වස්තු පිටපත් කිරීම (copy) සඳහා භාවිතා කරයි.
B. Ctrl + X යන්න ලේඛණයක ඇති පාඨ හෝ වස්තු කැපීම (cut) සඳහා භාවිතා කරයි.
C. Ctrl + P යන්න පිටපත් කරන ලද පාඨ හෝ වස්තු අලවීම (Past) සඳහා භාවිතා කරයි.
ඒ අනුව සත්‍ය ප්‍රකාශය වන්නේ,
i. A හා B පමණි. ii. B හා C පමණි. iii. A සහ C පමණි. iv. A, B හා C පමණි.

19) පහත දැක්වෙන දෑ අතරින් ලේඛණයක් තෝරා ගැනීම් සම්බන්ධයෙන් සත්‍ය වනුයේ,
A. සම්පූර්ණ ලේඛණයම තෝරා ගැනීම සඳහා භාවිතා කළ යුතු කෙටි මං යතුර වන්නේ Enter Key වේ.
B. වචනයක් තෝරා ගැනීම සඳහා මූසිකය එකවිට දෙවරක් වචනය මත ක්ලික් කළ යුතුය.
C. වාක්‍යයක් තෝරා ගැනීම සඳහා වාක්‍යයේ පළමුවන වචනය මුල ක්ලික් කරගෙන අවසාන වචනය අවසන්වෙන තෙක් ඇදීය යුතුය.

ඉහත තෝරා ගැනීම් සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,
i. B පමණි. ii. A හා B පමණි. iii. A සහ C පමණි. iv. B හා C පමණි.

(20) පිටුවක දිශානතිය වෙනස් කර ගැනීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගයක පහත සඳහන් කුමන මෙවලම භාවිතා කළ යුතුද?

i. ii. iii. iv.

(21) කදා පසුතලය මගින් ලබාදෙන පහසුකම් වන්නේ,

A. කදාවේ පසුබිමට විවිධ වර්ණ එකතු කර ගැනීම.

B. පසුබිමට හැඩතල රටා අන්තර්ගත කර ගැනීම.

C. පසුබිමට පින්තූර හෝ චිත්‍රක අන්තර්ගත කර ගැනීම.

ඉහත පහසුකම් අතුරින් සත්‍ය වන්නේ,

i. A පමණි. ii. A හා B පමණි. iii. C පමණි. iv. A, B හා C පමණි.

(22) වළාකුළු පරිගණක සංකල්පය හරහා ලබාගත හැකි ඉ-සමර්පන මෘදුකාංගයක් වන්නේ,

i. Open Office.org Impress ii. Microsoft One Drive Word'

iii. MS Office - 365 Power point iv. MS Office - 365 Excel

*** පහත දැක්වෙන දත්ත සමුදා වගු ඇසුරින් 23 හා 24 ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

| සිසු වගුව | | |
|---|---|---|
| ඇතුලත්වීමේ අංකය | නම | ශ්‍රේණිය |
| 45507 | අමල් | 10A |
| 45508 | කසුන් | 10A |
| 45509 | මාලා | 10C |
| 45510 | විමලා | 10D |

| පොත් වගුව | |
|---|---|
| පොතේ නම | පොත් අංකය |
| මඩොල්දූව | 1007 |
| හත්පන | 1008 |
| හීන් සැරය | 1009 |
| සුදු නෙළුම | 1005 |

| ශිෂ්‍ය පොත් වගුව | | | |
|---|---|---|---|
| ඇතුලත්වීමේ අංකය | පොත් අංකය | ලබාගත් දිනය | භාරදුන් දිනය |
| 45510 | 1007 | 2017/05/11 | 2017/05/29 |
| 45508 | 1009 | 2017/05/13 | 2017/05/31 |
| 45509 | 1008 | 2017/05/31 | 2017/06/13 |
| 45510 | 1005 | 2017/06/03 | 2017/06/20 |

(23) ඉහත ශිෂ්‍ය පොත් වගුවේ ක්ෂේත්‍ර සඳහා ගැලපෙන දත්ත ප්‍රරූප පිළිවෙලින් දැක්වෙන්නේ කුමන පිළිතුරේද?

i. Number, Number, Date/Time, Date/Time ii. Text, Number, Date/Time, Date/Time

iii. Number, Text, Text, Text iv. Text, Text, Date/Time, Date/Time

(24) ඉහත ශිෂ්‍ය පොත් වගුවේ ප්‍රාථමික යතුරු ක්ෂේත්‍ර/ක්ෂේත්‍රය වන්නේ,

i. ඇතුලත්වීමේ අංකය. ii. පොත් අංකය.

iii. ඇතුලත්වීමේ අංකය හා පොතේ අංකය. iv. ලබාගත් දිනය.

(25) එකිනෙකට සම්බන්ධ වගුවල දත්තවලින් අවශ්‍ය තොරතුරු තෝරා ලබා ගැනීමට

i. වගු භාවිතා වේ. ii. පෝරම භාවිතා වේ. iii. විමසුම් භාවිතා වේ. iv. වාර්ථා භාවිතා වේ.

(26) ප්‍රාථමික යතුර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. ප්‍රාථමික යතුර යනු වගුවක රෙකෝඩයක් අනන්‍යව හඳුනා ගත හැකි තීරු දෙකක් හෝ වැඩි ගණනක සංයෝජනයකි.

ii. පුද්ගල නාමය ප්‍රාථමික යතුර සඳහා උදාහරණයකි.

iii. ප්‍රාථමික යතුරු ක්ෂේත්‍රයක සමාන අගයන් නොපැවතිය යුතුය.

iv. ප්‍රාථමික යතුරු ක්ෂේත්‍රය හිස්ව තිබිය හැක.

(27) දත්ත සමුදායක ලක්ෂණයක් ලෙස සැලකිය **නොහැක්කේ,**

i. දත්තවල සමතිරික්තතාව උපරිම වීම. ii. දත්ත වල සංගතතාව පැවතීම.

iii. දත්ත හැසිරවීමේ කාර්යක්ෂමතාව වැඩිවීම. iv. නිරවද්‍යතාව වැඩිවීම.

(28) දත්ත සමුදාය කළමණාකරණ පද්ධති මෘදුකාංගයක් සඳහා උදාහරණයක් ලෙස ගත **නොහැක්කේ,**

i. Access ii. Base iii. Oracle iv. Lotus 123

(29) පාසල් සිසුහු විෂය බාහිර කටයුතු වශයෙන් සමූහ (කණ්ඩායම්) ක්‍රීඩා කරති. පාසලේ දැල් පන්දු, වොලිබෝල්, ක්‍රිකට්, වශයෙන් ක්‍රීඩා කීපයක් පවතින අතර, එක් සිසුවෙකුට අවම වශයෙන් එක් ක්‍රීඩාවක නිරතවිය යුතුය. එක් ක්‍රීඩාවයක් සඳහා සිසුන් කණ්ඩායමක් සිටිය යුතුය. ඉහත දත්ත අනුව සිසුන් හා ක්‍රීඩා වගු අතර පවතින්නේ,

i. ඒක-ඒක සම්බන්ධතාවකි. ii. ඒක-බහු සම්බන්ධතාවකි.

iii. බහු-බහු සම්බන්ධතාවකි. iv. කිසිම සම්බන්ධතාවයක් නොමැත.

(30) පැතිරුම් පතක A1 හා B1 කෝෂ වල පිළිවෙලින් 12 සහ 34 යන සංඛ්‍යා අඩංගු වන අතර =A1&B2 යන්න යම් කෝෂයක අඩංගුවේ,නම් එහි දක්නට ලැබෙන්නේ,

i. 46 ය. ii. 1234 ය. iii. 12 34 ය. iv. දෝෂයක් දක්වයි.

(31) රූපයේ දැක්වෙන පැතිරුම් පතට අදාළව යම් කෝෂයක =COUNT(A1:B3) යන් ඇතුළත් කළේනම් එහි දක්නට ලැබෙන්නේ,

| | A | B |
|---|---|---|
| 1 | 24 | 0 |
| 2 | 45 | |
| 3 | abc | 25 |

i. 5 ය.
ii. 4 ය.
iii. 3 ය.
iv. දෝෂයක් දක්වයි.

(32) 31 වන ප්‍රශ්ණයට අදාළ රූපයේ දැක්වෙන පැතුරුම් පතට අදාළව යම් කෝෂයක =AVERAGE(A1:A3,B1) යන්න ඇතුළත් කළේනම් එහි දක්නට ලැබෙන්නේ,
i. 23    ii. 34.5    iii. 17.2    iv. 69

(33) පැතිරුම් පත් වලට අදාළ පහත දැක්වෙන ප්‍රකාශ වලින් වැරදි ප්‍රකාශය තෝරන්න.
i. සූත්‍රයක් ආරම්භ කළ යුත්තේ = ලකුනිණි.
ii. SUM() ශ්‍රිතය තුල කෝෂ ලිපින ලබා දිය යුත්තේ කොමා වලින් වෙන්කරය එහෙත් එක ලඟ පිහිටි කෝෂ නම් කෝෂ පරාසයක් උවද ලබාදිය හැක.
iii. ශ්‍රිතයක දක්වන කෝෂ පරාසයක් යන්න එයට අයත් කෝෂ කොමා වලින් වෙන්කර දැක්වීම හා සමානය.
iv. ශ්‍රිතයක මුලින් = ලකුණ යෙදිය යුතුය.

(34) 19 MOD 20 යන්නේ පිළිතුර වන්නේ,
i. 19 ය.    ii. 20 ය.    iii. 1 ය.    iv. 0 ය.

(35) පහත දැක්වෙන ක්‍රමලේඛ කොටස් ප්‍රතිදානය විය හැක්කේ,

```
Write ('Saman'); Write (75); Writeln ('Amal'); Write(79);
```

i. Saman 75
Amal 79
ii. Saman 75 Amal
79
iii. Saman 75 Amal 79
iv. Saman
75
Amal
79

(36) Pascal පරිගණක භෂාවේ වලංගු හඳුන්වනයක් නොවන්නේ,
i. _Num    ii. Num1    iii. Num_1    iv. Num#

(37) පහත දැක්වෙන ක්‍රමලේඛ කොටසේ ප්‍රතිදානය විය හැක්කේ,

```
Program abc Var n:InTeGer;
Begin
        n:=0;
        While n<=5 do
        Begin Write (n);n:=n+1; end;
        Write(n);
End.
```

i. 012345
ii. 0129456
iii. 12345
iv. දෝෂයක් දක්වන නිසා සම්පාදනය කළ නොහැක.

(38) Pascal ක්‍රමලේඛයක අඩංගු 20 DIV 6 යන ප්‍රකාශයේ ප්‍රතිදානය විය හැක්කේ,
i. 2 ය.    ii. 3 ය.    iii. 4 ය.    iv. 3.3333333333E+000

(39) Writeln(234.56); යන පැස්කල් ප්‍රකාශනයේ ප්‍රතිදානය වන්නේ,
i. 2.3456000000000000E+002    ii. 234.56
iii. 234    iv. 2.3456000000000000E-002

(40) Bool යන බූලියාන විචල්‍යට අගය පැවරීම සඳහා වලංගු ප්‍රකාශය වන්නේ,
i. Bool:=falsE;    ii. Bool:='True';    iii. Bool=False;    iv. True:=Bool;